

# වරාය සටන කම්කරුවන්ගේ ජයග්‍රහණයක්!

*වරායේ නැගෙනහිර පර්යන්තය රැක ගැනීම සඳහා වරාය සේවකයන් මුල් වී ගෙනගිය අරගලය පසුගිය සතියේ තාවකාලිකව අවසන් වූයේ ඔවුන්ගේ ඉල්ලීම ජයග්‍රහණය කිරීමෙනි. වරාය වෘත්තීය සමිති සියල්ලම එක්සත්ව අකුරට වැඩ කිරීමේ වෘත්තීය සමිති ක්‍රියා මාර්ගය සාර්ථක වීමේ ප්‍රතිඵලයක් ලෙස නැගෙනහිර පර්යන්තය අදානි සමාගමට පවරා දීමේ ප්‍රයත්නය හකුලා ගැනීමට රජයට සිදු විය. එසේ වුවද රජය එම පියවර පසුපසට ගත්තේ වරායේ බටහිර පර්යන්තය ඉන්දියාවට දීමට වෘත්තීය සමිති එකඟ කරවා ගැනීමෙනි. වරායේ මෙම සටනට වත්මන් රජයට බලයට ඒමට සහාය දෙන ජාතික බලවේගද, භික්ෂූන්ද එක් විය. බටහිර පර්යන්තය බිළි දී නැගෙනහිර පර්යන්තය රැක ගැනීම වරාය සටන පාවා දීමක් ලෙස සමහරුන් හඳුන්වා දෙයි. එනිසා මේ පිළිබඳව වමේ හඬ මෙම සටනට සහාය දුන් නායකයන් කිහිප දෙනෙකුගේ අදහස් විමසා සිටියේය. ඔවුන් ගේ අදහස් පහතින් දක්වමු.*

## ජනතාවට අයත් දේපල ගැන ආණ්ඩුවට තනියෙන් තීන්දුවක් ගන්න බැහැ

### ජෝසප් ස්ටාලින්

*ලංකා ගුරු සංගමයේ සභාපති*



අපි ප්‍රතිපත්තියන් ලෙස පුද්ගලිකකරණයට විරුද්ධයි. ඒක නැගෙනහිරද බටහිරද කියල අදාල නැහැ. වරාය සටන ආරම්භ කිරීමට පෙර ආණ්ඩුව නැගෙනහිර ජැටිය අදානි ට දෙන්න තීන්දුවක් අරගෙනයි ආවෙ. ඒකට විරුද්ධව වරායෙ සටනට සහාය දෙන්න ජාතිකවාදී කොටස් සහ ආගමික නායකයන් එකතු වුණා. ඒකත් අපි පරාජය කළ යුතුයි. ජනතාවට අයත් දේපල ගැන ආණ්ඩුවට තනියෙන් තීන්දුවක් ගන්න බැහැ. ජනතාවගෙනුත් විමසිය යුතුයි. කම්කරුවන් වරාය පමණක් නෙමෙයි රටේ සියළුම ක්ෂේත්‍රවල පුද්ගලිකකරණය කිරීම පරාජය කිරීමට එකඟ විය යුතුයි. ආණ්ඩුව කටයුතු කරන්න හැදුවේ ජාතික බලවේගවලටත් එහා ගිහින්. අපිට හැකියාව ලැබුණා ආණ්ඩුවේ සහ පුද්ගලික අංශයේ වෘත්තීය සමිති ගණනාවක සහාය වරාය සටනට ලබා දෙන්න. අපිට ශක්තිමත් වාම සහ වෘත්තීය සමිති ව්‍යාපාරයක් ගොඩ නගනව නම් කරන්න බැරි දෙයක් නැහැ.

## නැගෙනහිර ජැටිය ගැන ජයක් ලැබුවත් ඉන්දියාවේ සහ ජපානයේ බලපෑම් අවසාන නැහැ



### චන්න දිසානායක

*ලංකා බැංකු සේවක සංගමයේ සභාපති*

සමස්තයක් වශයෙන් ගත්තහම වරාය සටනේ ජයග්‍රහණය යම් කොටසක ජයක්. බටහිර දෙනව කියන්නෙ යම් කුමන්ත්‍රණයක කොටසක්. දැනට අපි නැගෙනහිර ජැටිය ගැන ජයක් ලැබුවත් ඉන්දියාවේ සහ ජපානයේ බලපෑම් අවසානයකට ඇවිත් නැහැ. හෙට දවසෙ වෙන්නෙ මොනවද කියල අපි දන්නෙ නැහැ. අපිට ලැබිල තියෙන තොරතුරු අනුව ත්‍රිකුණාමලේ තෙල් ටැංකි තියෙන ප්‍රදේශයට හමුදාවටවත් යන්න බැහැ. ආණ්ඩුව ඉටහිර දෙන්න කටයුතු කරනව නම් ජනතාව ඒකටත් අභියෝග කරයි. අපි සූදානම් ඕන වෙලාවක ජාතික සම්පත් පුද්ගලිකකරණයෙන් බේරාගන්න අරගල කරන්න. එප්පාවල පොස්පේට් නිධිය විකුණන්න යද්දිත් ඒකට විරුද්ධ සටනට බැංකු සේවක සංගමය නායකත්වය ගත්තා.

## උතුරේ ජනතාව නිවැරදිව පෙන්නල තියෙනව අපි බය නැහැ කියල

### චින්තක රාජපක්ෂ

*ඉඩම් සහ කෘෂිකර්ම ප්‍රතිසංස්කරණය සඳහා වූ ව්‍යාපාරය*



වරාය සටන ජනතාවගේ ජයග්‍රහණයක්. අද වෙනකොට ගෝඨාබය රාජපක්ෂට තිබුණු ප්‍රතිරූපය විනාශ වෙලා ගිහින්. ඔහු කටයුතු කරන්න ගියේ ආණ්ඩුවට සහයෝගය දුන්න කණ්ඩායම්වලටත් පස්ස හරවලයි. උතුරේ ජනතාව නිවැරදිව පෙන්නල තියෙනව අපි බය නැහැ කියල. නැගෙනහිර පර්යන්තයට විරුද්ධව එළියට බැහැපු අයට වඩා උතුරෙ මිනිස්සු ගෝඨාබයට බය නැති බව පෙන්නල තියෙනව. අපි ඒක හරියට කියව ගන්න ඕන. වරායෙ දි ජාතික බලවේගයන් ඉස්මතු වෙලා දකුණේ පංති ව්‍යාපාරයේ අඩුවක් පෙන්නුවා. එම සටන අවසන් වුණේ ජාතිකවාදී බලවේගවලට වාසිදායක වෙන ආකාරයටයි. ඒ වගේම ඔවුන්ගේ ඊනියා ජාතිකතවයත් ඒකෙන් හෙළිදරව් වුණා. ආණ්ඩුවේ ජනතා විරෝධී කටයුතුවලට එරෙහිව පෙළ ගැසීම්වලදී ජාතිකවාදී බලවේගවලටත් මුහුණ දීමට සිදු වේවි.

## අමෙරිකානු අවශ්‍යතාවයට ලංකාව නුදුරු අනාගතයේදී බල අරගලයක පොර පිටියක් වෙනවා

### ජගත් ගුරුසිංහ

*ශ්‍රී ලංකා ටෙලිකොම් සියළු සේවක සංගමයේ සභාපති*



වරාය සටනේ යම්කිසි ජයග්‍රහණයක් තියෙනවා. ඒත් ඒක පැහැදිලි ස්ථාවරයක නැහැ. සමහර විට නැගෙනහිර දෙන්න වෙන්නත් ඉඩ තියෙනවා විදෙස් රටවල බලපෑමට. වෘත්තීය සමිති නියමිත ජයග්‍රහණය වෙනුවෙන් නොවෙයි පෙනී සිටියෙ. ධනවාදී පක්ෂවල වෘත්තීය සමිතිවලින් මීට වඩා දෙයක් බලාපොරොත්තු වෙන්න බැහැ. ඉන්දියාව කටයුතු කරන්නේ දැඩි අධිරාජ්‍යවාදී ප්‍රතිපත්තියක සිටයි. අමෙරිකානු අවශ්‍යතාවයට ලංකාව නුදුරු අනාගතයේදී බල අරගලයක පොර පිටියක් වෙනවා. කොළඹත් ඉන්දියාවට කැලි, චීනෙට කැලි වෙන් කරගෙන තියෙනවා. අපි මේ තත්වය ජනතාවට පැහැදිලි කර දිය යුතුයි.

## නැගෙනහිරට පෙන්වූ විරෝධය බටහිරට ජැටිය වෙනුවෙනුත් පෙන්විය යුතුයි

### ලීනස් ජයතිලක

*එක්සත් කම්කරු සම්මේලනය*



නැගෙනහිර ජැටිය විකිණීමේ ආණ්ඩුවේ උවමනාව පැරදවීම පැහැදිලිවම වරාය කම්කරුවන්ගේ මෙන්ම සමස්ත පංති ව්‍යාපාරයේම ජයග්‍රහණයක්. නැගෙනහිරට පෙන්වූ විරෝධය අපි බටහිරට ජැටිය සම්බන්ධයෙනුත් පෙන්විය යුතුයි. අපි හොඳටම දන්නවා වරායේ පොහොට්ටු සමිතිය හැදුවෙ පොහොට්ටු දේශපාලනේ ජයග්‍රහණය කරවන්න මිස සටන් කරන්න නොවන විත්තිය. නමුත් ජැටිය බේරගන්න ආවහම ඒ නායකයන්ටත් ආණ්ඩුවේ තර්ජනවලට මුහුණ දෙන්න වුණා. ඇමති පැහැදිලිවම කිවුව ආණ්ඩුවෙ සමිති ආණ්ඩුව වෙනුවෙන් පෙනී ඉන්න ඕන කියල. සමිති නායකයන්ට මරණීය තර්ජන ආවහම ඒ ගොල්ලන්ට ජාතික බලවේග සමග හේත්තුවෙන්නත් සිදු වුණා. මෙම සටනේ ජයග්‍රහණය තුල වරායෙ සමිති එකතු වුණා වගේම විශේෂයෙන් පොහොට්ටු ශ්‍රී ලංකා සමිතිවල තිබුණු තරහ මරහව නැති වෙන එකත් පංතියට ලොකු ශක්තියක් වේවි.

## ඉන්දියාවට දීම ගැන ආණ්ඩුව පසුබැස්සේ තාවකාලිකවයි

### නීල් විජේතිලක

*එක්සත් පොදු සේවක සංගමයේ ප්‍රධාන ලේකම්*



වරාය කම්කරුවන්ගේ සටන ඉදිරියේ නැගෙනහිර පර්යන්තය ඉන්දියාවට දීම සම්බන්ධව ආණ්ඩුව පසුබැස්සේ තාවකාලිකව යි. ආණ්ඩුව බටහිර ජැටිය ඉන්දියාවට භාර දීමට සූදානම් වුණත් ඒක ඉන්දියාවෙන් බාර ගනියිද කියලා අපි දන්නේ නෑ. වරාය වෘත්තීය සමිති ඒකට එකඟ වෙලා තියෙනවා. ඒක ඉන්දියාව බාර ගත්තෙ නැත්තං චීනෙට දෙන්නත් ඉඩ තියනව. අපි මේ ප්‍රතිපත්තිය පරාජය කළ යුතුයි. වරායෙ වුනු දේ ආදර්ශයට අරගෙන අනිත් තැන් වලටත් ආණ්ඩුව ඔය උපක්‍රමයම යොදන්න පුළුවන්. තව රාජ්‍ය ආයතන ගණනාවක් PPP ක්‍රමයට විකුණන්න යනවා. ඒ නිසා වරාය කම්කරුවොත් එක්ක අනෙක් වෘත්තීය සමිති එකතු වෙලා බටහිර ජැටිය විකුණනවට විරුද්ධවත් සටන් කරන්න ඕන.

## ඒ මොහොතෙදි ඒ සටන් පාඨය නිවැරදියි

### ලාල් බංගමුව

*ස්වාධීන වරාය සේවක සංගමයේ සභාපති*



සේවකයන් අරගලය කළේ මූලික ප්‍රශ්නය වෙලා තිබුණු නැගෙනහිර ජැටිය බේරගන්න. ඒ මොහොතෙදි ඒ සටන් පාඨය නිවැරදියි. බටහිර ජැටිය කියන්නේ මුහුද විතරයි. ඉන්දියාව ඒක හදනව නම් ඩොලර් මිලියන 3000 ක් විතර යනව. ඒක නිසා ඉන්දියාව බටහිර භාර ගනියි කියල හිතන්න අමාරුයි. කොහොම වුනත් දැනට ආණ්ඩුව තීරණය කරල තියෙන්නෙ වරාය අධිකාරිය මගින් නැගෙනහිර ජැටියෙ ඉතිරි වැඩත් ඉවර කරන්න. ඒකට අවශ්‍ය ක්‍රේන් ආදිය ගේන්න. ඒ වැඩ ඉවර වෙනකොට මොන ආණ්ඩුවක් තියෙයිද? ඒ අය කාට දෙයිද කියල දැන්ම කියන්න බැහැ. අපි බටහිර ජැටිය දෙනවටත් විරුද්ධයි. පොදු එකඟත්වය මත ලිපිය අත්සන් කළත් බටහිර විකුණන්න ගියොත් ඒකට විරුද්ධව සටන් කරන්නත් අප ලෑස්තියි.